# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1784/12 - 2012 නොවැම්බර් මස 14 වැනි බදාදා - 2012.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

*ව්‍යවස්ථාපිත නිශ්චය අංකය* :-4628.

විශේෂ අංකය :- මහ/324.

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චයේ අඩුව සම්පූර්ණ කිරීම**

අලවතුගොඩ, මාතලේ පාරේ, අංක 277 දරන නිවසෙහි පදිංචි ගමේ ගුරුන්නාන්සේලාගේ ගෙදර අබ්දුල් කාදර් ඉස්මන් උම්මා මහරූෆ් මහත්මිය විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කාරියට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඇයට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටසක් නිශ්චය කරමින් අංක 1384/23 හා 2005.03.17 වැනි දින 4594 ව්‍යවස්ථාපිත නිශ්චය අංකය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ලබා දී ඇත. එකී ව්‍යවස්ථාපිත නිශ්චයේ අඩුව සම්පූර්ණ කිරීම සඳහා (නාමිකව) ව්‍යවස්ථාපිත බදු ගැණුම් කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි උපලේඛනයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2012 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ මැදසිය පත්තුව සුළු කොට්ඨාසයේ වාරියපොල ගමේ පිහිටි රජයේ මිනින්දෝරු අයි. කේ. සමරකෝන් මහතා විසින් අඳින ලද 2011.01.14 වැනි දිනැති අනුරේඛන අංක MA/LRC/2011/125 දැක්වෙන වාරියපොල වත්ත නමැති ඉඩමේ කැබලි අංක A, B, C දරන බිම් කැබලිවලින් දැක්වෙන හෙක්ටයාර් 2.4371 (අක්කර 06, රූඩ් 0, පර්චස් 03.05)ක ප්‍රමාණය සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද වේ.

11-1031